**බුලත්සිංහල ප්‍රාදේශීය සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 22 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් 2015 වර්ෂය තුළ පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.3,232,282 ක් වූ කැබ් රථය, රු.6,009,602 ක් වූ ට්‍රක් රථය හා රු.25,100 ක් වූ අත්කරත්තය සහ සමාලෝචිත වර්ෂය තුළ රු.25,100 කට මිලදී ගෙන තිබූ කසල කරත්තය ප්‍රාග්ධනිත නොකිරීමෙන් රු.9,292,084 කින් මෝටර් රථ හා කරත්ත ගිණුම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක ජනරාල්ට ගෙවිය යුතු මුදල රු.2,993,928 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.1,260,918 ක් ලෙස දැක්වීම හේතුවෙන් ගෙවිය යුතු මුදල රු.1,733,010 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

තවද සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම වැටුප් දායකය රු.31,010 ක් අඩුවෙන් ආදායම් හා වියදම් ගිණුමේ දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම වශයෙන් රු.6,670,809 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇස්තමේන්තු කර තිබුණු අතර එයින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ලැබී නොතිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු මුදල රු.6,670,809 ක් විය යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.3,181,358 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව ලැබිය යුතු මුද්දර ගාස්තු රු.3,489,451 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන ආධාර මුදල රු.12,584,755 ක් වුවත්, එය මූල්‍ය ප්‍රකාශනවල රු.13,293,928 ක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර මුදල රු.709,173 කින් වැඩියෙන් දක්වා තිබුණි.

තවද 2015 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැති ශේෂය රු.36,920,159 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.37,629,332 ක් වශයෙන් දැක්වීම හේතුවෙන් කර්මාන්ත ණයගැති ශේෂය රු.709,173 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාල මූලධන වියදම් රු.12,651,351 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.12,487,441 ක් ලෙස දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම් රු.163,910 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2015 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමි ශේෂය රු.5,913,718 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.5,498,827 ක් ලෙස දැක්වීම හේතුවෙන් කර්මාන්ත ණයහිමි ශේෂය රු.414,891 කින් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 03 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු. 252,655 ක් වූ අතර ඒවාට අදාල උපලේඛනවල ශේෂයන්ගේ එකතුව රු. 277,924 ක් වූයෙන් රු.25,269 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 <u>අවිනිශ්චිත ගිණුම</u>

සමාලෝචිත වර්ෂය අවසානයට අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය වූ රු.2,534,272 ක් නිරවුල් කර නොතිබුණි.

1.3.4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

රු.7,399,960 ක ලැබිය යුතු උසාවි දඩ මුදල් තහවුරු කරගැනීම සඳහා කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවීය.

1.3.5 <u>නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුව පරිගනක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි මුදල් රෙගුලාසි 371(අ) ප්‍රකාරව කිසියම් කාර්යයක් සඳහා දෙනු ලබන අත්තිකාරම් මුදලක් එම කාර්යය නිම වූ වහාම පියවිය යුතු වුවද, රු.48,795 ක් වූ අත්තිකාරම් ශේෂය විගණිත දිනය වූ 2016 මැයි 30 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 1647(ආ) ප්‍රකාරව සභාව සතුව පවත්නා වාහන හා ඒවායේ උපකරණ පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් වාර්ෂිකව සිදු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු.11,649,735 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු.3,672,077 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.901,648 ක් වූ හිඟ ආදායම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්ති වල විධිවිධාන අනුව අයකර ගෙන නොතිබුණි.

#### 2.2.2 වරිපනම් බදු

(අ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු බිල් කිරීම රු.2,052,880 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 දිනට ඉන් රු.1,410,217 ක් හෙවත් සියයට 64 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.131,010 ක් වූ අතර ඉන් රු.15,437 ක් හෙවත් සියයට 12 ක ප්‍රමාණයක් අයකර තිබුණි. වර්ෂය අවසානයට මුළු හිඟය රු.758,136 ක් විය

#### 2.2.3 අක්කර බදු

2015 වර්ෂයට පෙර වර්ෂයන්ට අදාලව අක්කර බදු රු.104,083 ක් හා 2015 වර්ෂයට අදාලව අක්කර බදු රු.45,000 ක් වූ බිල් කිරීම් ශේෂයෙන් බදු ඒකක 92 කට අදාලව රු.36,379 ක හිඟ ශේෂයක් පැවති අතර විගණිත දිනය වූ 2016 ජනවාරි 28 දින වන විටත් එම මුදල අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 11,058,683 ක මුදලක් පහත පරිදි ලැබිය යුතුව තිබුණි.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 7,877,326 |
| මුද්දර ගාස්තු | 3,181,357 |

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3:1 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

(අ) දේශීය ණය හා සංවර්ධන අරමුදලට පොලී හා වාරික ප්‍රමාද වී ගෙවීම මත රු.18,878 ක දඩ මුදල් ගෙවා තිබුණි.

**(ආ)** සේවය හැර ගිය, මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 11 දෙනෙකු සඳහා ලබා දී තිබූ රු.176,803 ක් වූ ණය ශේෂය 2015 දෙසැම්බර් 31 දින වන විටද අයකරගැනීමට කටයුතු කර නොතිබුණි

**3.2** <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ) සභාව මගින් නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා 2008 පෙබරවාරි 26 දින රු.123,500 කට ඇඟිලි සළකුණු යන්ත්‍රයක් මිලදීගෙන තිබූ අතර 2013 අප්‍රේල් මස එම යන්ත්‍රය අක්‍රියවී අළුත්වැඩියාව සඳහා 2013 මැයි 08 දින රැගෙන ගොස් තිබුණි. සභාව 2014 පෙබරවාරි 15 දින අලුත්වැඩියාව සඳහා වූ ඇස්තමේන්තු මුදල වූ රු.54,264 ක් ගෙවා තිබුණද එම යන්ත්‍රය සභාව වෙත ලබාගැනීමට 2016 ජනවාරි 20 දින තෙක් කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 07 දින කැබ් රථය අළුත්වැඩියාව සඳහා පෞද්ගලික ආයතනයක් වෙත සභා අරමුදලින් රු.22,800 ක් ගෙවා තිබූ අතර වග කිව යුතු පාර්ශවයන් හඳුනාගෙන එම මුදල අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) බුලත්සිංහල මහජන පුස්තකාලයේ 2014 වර්ෂයේ සිදු කරන ලද සමීක්ෂණයට අනුව රු.17,015 ක් වටිනා පොත් 68 ක් හා පොලේගොඩ මහජන පුස්තකාලයේ රු.1,495 ක් වටිනා පොත් 09 ක් අස්ථානගත වී තිබූ අතර එම අස්ථාන ගත වූ පොත් සම්බන්ධයෙන් වග කිව යුතු නිලධාරීන්ගෙන් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 <u>නිල ඇඳුම් දීමනා ගෙවීම</u>

(i) 2013 අප්‍රේල් 22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2013(අ) ට අනුව මෙතෙක් රියදුරන්ට හා කාර්යාල සේවක සේවයේ නිලධාරීන්ට ලබා දුන් නිල ඇඳුම් හා මැහුම් කුලිය වෙනුවට රු.4,000 ක වාර්ෂික දීමනාවක් 2013 ජනවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි ගෙවිය යුතු වුවත් එකී චක්‍රලේඛයට පටහැනිව රු.183,215 ක් වැය කොට නිල ඇඳුම් ලබාදී තිබුණි.

(ii) ඉහත චක්‍රලේඛයේ (ආ) පරිදි නිල ඇඳුම් දීමනාව ලබන නිලධාරීන් රාජකාරි වේලාවේදී නිල ඇඳුම් නොපළඳින්නේ නම් ඒ සම්බන්ධයෙන් 1991 අගෝස්තු 07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/91 හි විධිවිධාන අනුව ක්‍රියාකිරීමට ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතු වුවත් සභාවේ නිල ඇඳුම් ඇඳීමට නියමිත හා නිල ඇඳුම් ලබාගත් නිලධාරීන් මහජන දිනයේදී පමණක් එය අඳින බව 2016 ජනවාරි 27 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

3.4 <u>අවිධිමත් ගනුදෙනු</u>

සභාවේ සේවය කරනු ලබන ආයුර්වේද වෛද්‍ය නිලධාරිනිය දින 2 ක් සඳහා පානදුර ප්‍රාදේශීය සභාවට අනුයුක්ත කර ඇති අතර එම සභාව යටතේ ආයුර්වේද බෙහෙත් ශාලාවක් නොමැති වුවද එම සභාවේ සේවය කිරිම වෙනුවෙන් එකී වෛද්‍යවරියට 2015 මැයි මස සිට සභාව මගින් රු.422,592 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

## 3.5 මානව සම්පත් කළමනාකරණය

2015 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර පහත පරිදි විය.

| | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| මාණ්ඩලික | 3 | 3 | -- |
| ද්විතීය | 36 | 32 | 4 |
| කණිෂ්ඨ | 117 | 115 | 2 |
| | 156 | 150 | 6 |

සභාවේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 06 ක් පැවතියද තථ්‍ය කාර්ය මණ්ඩලය, අනුමත කාර්ය මණ්ඩලය බවට පත් කර ගැනීමට විධිවිධාන යොදා නොතිබුණි.

## 3.6 කොන්ත්‍රාත් පාලනය

තිරිවානාකැටිය වත්ත මහගම වතුයායේ ඉහල වෙල්ගම සිං කීනස්වත්ත මාර්ගයේ කොටසක් දිග මීටර් 265 ක්ද, පළල මීටර් 2.74 ක්ද වශයෙන් කොන්ක්‍රීට් කිරීම සඳහා රු.1,500,000 කට ගිවිසුම් ගත වී තිබූ අතර ප්‍රසාරණ මූට්ටු සඳහා රු.31,858 ක් ගෙවා තිබුණද 2016 ජනවාරි 27 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී ප්‍රසාරණ මූට්ටු දිග මීටර් 32, 30 ආදී වශයෙන් දුරකින් යොදා තිබුණි. මාර්ගතලයේ ස්ථාන 02 කදී පිපිරීම් ඇති බව නිරීක්ෂණය විය.

## 4. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පාලනය